# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2245/32 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: ඉ4/දැදුරු ඔය/අත්පත්/5 වෙළුම.*
*ඉඩම් අමාත්‍යාංශ අංකය: එල්ඩී/05/2010/අයිආර්/83.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතා ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාහුල්ඕතොට කෝරළයේ සුළු කොට්ඨාසයේ කිරිදිගල්ල, බෝගොල්ලාගම, රන්දෙනිගම යන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2014.10.22 හා 2014.09.30, 2014.10.31 දිනැති අ. ග. පි. 2941 හි පත්‍ර අංක 7, අතිරේක අංක 7-අ.ග.පි. 1986හි පත්‍ර අංක 2, අතිරේක අංක 2 අ.ග.පි 2959 හි පත්‍ර අංක 01 අතිරේක අංක 3 අ.ග.පි. 2938 හි පත්‍ර අංක 01 හි අතිරේක අංක 01 දරන සැලසුම්පත් වල සඳහන් වර්ගඵලය හෙක්ටයාර 0.2747ක් පමණ වූ පහත විස්තර ලැයිස්තුවේ සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් බිම් කොටස් තුන (03).

**අ. ග. පි. 2941**

**01. කැබලි අංක 897**
ඉඩමේ නම: මීගහමුල හේන; ඉඩමේ විස්තරය: වත්ත, හිමිකම් කියන්නා: රජය, එම්. ඒ. බී. එම්. ආලෝක බණ්ඩාර අනවසරයෙන් වගාකර ඇත; ප්‍රමාණය: හෙක්. 0.0173.

**02. කැබලි අංක 875**
ඉඩමේ නම: කිරිදිගල්ලේ මහවැව; ඉඩමේ විස්තරය: වත්ත, හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.1941.

**අ. ග. පි. 1986**

**01. කැබලි අංක 346**
ඉඩමේ නම: පාරගාව හේන; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය, සී. ජේ. එම්. එම්. එස්. චන්ද්‍රසේකර, අනවසරයෙන් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්. 0.0132.

**අ. ග. පි. 2959**

**01. කැබලි අංක 167**
ඉඩමේ නම: හබහේන, කෝන්ගහමුල හේන සහ සියඹලාගහමුලහේන; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන්නා: ඩී. එම්. සුමනාවතී; ප්‍රමාණය: හෙක්. 0.0484.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අ. ග. පි. 2938

01. **කැබලි අංක 95**

ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; ඒ. බී. අභයසිංහ මුදියන්සේ අනවසරයෙන් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්. 0.0017.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2021 ඔක්තෝබර් මස 25 දින පෙ. ව. 9.00ට නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2021 ඔක්තෝබර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ජේ. එම්. අයි. ආර්. කේ. ජයසුන්දර,**
ප්‍රාදේශීය ලේකම්,
නිකවැරටිය.

2021 සැප්තැම්බර් මස 17 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.